## 2014 ජූනි මස රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ඇති වූ අර්බුදයේ ඇතුළාන්තය

20,000ක් පමණ වූ සාමාජිකත්වයක් ඇති අවුරුදු 88 ක් ඉපැරණි දේශපාලනීකරණය නොවූ ප්‍රජාතාන්ත්‍රික ලෙස ක්‍රියාත්මක වන වෘත්තිය සමිතියක් වන රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ක්‍රියාකාරීත්වය අඩපන කිරීමේ අටියෙන් 20ක් පමණ වූ වෛද්‍යවරු අතලොස්සක් විසින් අධිකරණ ක්‍රියාවලියක් තුලින් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට හානිවන කඩා කප්පල් ක්‍රියාවල යෙදීමේ අභියෝගයකට මුහුණ දීමට සිදු විය.

20 ක් පමණ වූ සාමාජිකයින් ගෙන ගිය අරගලය බිඳ හෙලීම සඳහා එක්ව ක්‍රියා කල 20,000ක් පමණ වූ සාමාජිකත්වය වෙනුවෙන් අවසානයේදී අධිකරණය මගින් පහත සඳහන් නිගමනයන්ට එලඹුණි.

1. 2013 ජූනි 28 දින කොළඹ දිසා අධිකරණයේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගම් විරෝධී වෛද්‍යවරුන් විසින් පවරන ලද නඩුව කොළඹ දිසා විනිසුරුතුමා විසින් **වංක ලෙස, සද්භාවයෙන් තොරව ද්වේෂ සහගත**ව කරන ලද බවට ප්‍රකාශ කරන ලදී.
2. ගල්කිස්ස දිසා අධිකරණයේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගම් විරෝධී වෛද්‍යවරුන් විසින් පවරන ලද අංක 1337/14/විශේෂ නඩුව මඟින් **අධිකරණ කාර්යාවලිය අයථා ලෙස අපහරණය** කර ඇති බවට ගරු විනිශ්චකාරතුමා 2014-08-06 දින තීරණය කරන ලදී.
3. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගම් විරෝධී වෛද්‍යවරුන් හා එක්ව භාරකරුවන් දෙදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් තුලින් **සංගමයේ ව්‍යවස්ථාව උල්ලංඝණය** කර ඇති බවට දිස්ත්‍රික් විනිශ්චයකාර තුමා ප්‍රකාශ කරන ලදී.
4. ප්‍රජාතන්ත්‍රවාදය බිඳ දැමීම ඉතාම බරපතල වැරැද්දක් බව පෙන්වා දෙන ගරු අධිකරණය එය සුරක්ෂිත කිරීමට පියවර ගෙන ඇත. ඡන්දයෙන් දිනීමට අපහසු පුද්ගලයෙකුට එම සංගමය බිඳ හෙලීමට අධිකරණය අවකාශ දී නැත. බහුතර මතයෙන් තීරණ ගන්නා සෙසු ආයතන වලට මෙය අස්වැසිල්ලකි.

එබැවින් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය රජයේ සෞඛ්‍ය සේවයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ජාතික වැදගත්කමක් ඇති පහත සඳහන් ක්‍රියාවලින් ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

- විශේෂඥ වෛද්‍යවරුන්, පරිපාලන වෛද්‍යවරුන් හා ශ්‍රේණිගත වෛද්‍යවරුන් සඳහා සමානාත්මකව ක්‍රියාකරනු ලබන ස්ථාන මාරු මණ්ඩල ආරම්භ කිරීම. දේශපාලනික හා අනිකුත් බලවේගයන්ට යටත් නොවී සමානාත්මතාවයෙන් යුතුව හැම ප්‍රදේශයකටම බෙදී යන ආකාරයෙන් මාරු වීම් ක්‍රියාවලිය සාඩම්බරව ඉටු කර ඇත. දිවයිනේ කොයිම ප්‍රදේශයක ජීවත් වුවද දුප්පත් පොහොසත් බේදයෙන් තොරව එක හා සමානව ජාත්‍යන්තර ප්‍රසාදයට ලක් වන සේ සෞඛ්‍ය සේවා සියලු ජාතීන් වෙත ලබා දී ඇත.
- 2013දී ආරම්භ කරන ලද සිංහල දෙමල භාෂා ප්‍රගුන කිරීමේ වැඩසටහන යටතේ 2007 උසස් පෙල කණ්ඩායම් සඳහා 8 වන කණ්ඩායම ලෙස සීමාවාසික වෛද්‍යවරුන් වෙනුවෙන් අගලවත්ත ජාතික භාෂා පුහුණු මධ්‍යස්ථානයේ භාෂා පුහුණුවීම් නැවත ආරම්භ කරනු ඇත.
- මීළග සීමාවාසික වෛද්‍යවරුන් සඳහා “Good Intern II” වැඩසටහන නුදුරු අනාගතයේදී ආරම්භ කිරීමටත් නොකඩවා එය පවත්වාගෙන යාමටත් කටයුතු කරනු ඇත.
- වෛද්‍යවරුන් සඳහා ඔවුන්ගේ සේවා තත්ත්වයන් උසස් මට්ටමින් පවත්වාගෙන යාමට අදාළ සන්නිවේදන කුසලතාවයන් ඔප් නැංවීම පිණිස III වන වැඩමුළුව ආරම්භ කරනු ඇත.
- 2014-2015 වර්ෂයන්ට වෛද්‍යවරුන්ගේ දරුවන්ට ජාතික පාසල් ලබා දීමේ වැඩ පිලිවෙල නැවත ඇරඹී ඇත.
- රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සාමාජිකයින් සඳහා වූ පුද්ගලික ණය, වාහන ලාංජන, තාවකාලික මාරු හා වාහන රක්ෂණ කිරීමේ කටයුතු පවත්වාගෙන යනු ඇත.
- වෛද්‍යවරුන් සඳහා වූ ශ්‍රේණි උසස්වීමේ කටයුතු නැවත ඇරඹේ.
- වෛද්‍යවරුන් සඳහා මූලික වැටුප් සංශෝධනය කිරීමේ කටයුතු කිරීමත් ඒ සඳහා වූ යෝජනා ක්‍රියාත්මක කිරීමත් කරගෙන යනු ඇත.

මීට අමතරව ජාතික වැදගත් කමකින් යුත් කටයුතු සම්බන්ධයෙන් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඉදිරිපත් වී ක්‍රියා කරනු ඇත.

01. ජාතික ඖෂධ ප්‍රතිපත්ති සංශෝධනය
02. හඳුනා නොගත් වකුගඩු රෝගයට අදාල අප සංගමයේ යෝජනාවලිය ජනාධිපති කාර්යසාදකය හා එක්ව ක්‍රියාත්මක කිරීම
03. කිරිපිටි හා කිරි ආහාර සම්බන්ධව අප සංගමයේ යෝජනා 10 ක්‍රියාත්මක කිරීම

**රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය 13/08/2014**